ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit

ගරු ස්වාමීන්වහන්ස/ මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනෙවියෙනි

2026/2027 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය)

බාහිර උපාධි පාඨමාලාවේ නම්නීකරණ වැඩසටහන

උක්ත උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි ගාස්තු හා පාඨමාලා ගාස්තු පළමු වාරිකය ගෙවා සම්පූර්ණ කළ සිසුන්ට අදාළ නම්නීකරණ වැඩසටහන 2026 නොවැම්බර් මස 15 වන දින පෙ.ව. 7.00 සිට උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

මෙදිනට ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත නිකුත් කිරීම, සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ව්‍යුහය සහ විෂය මාලාව හඳුන්වාදීම, අධ්‍යයන කටයුතු හා විභාග පැවැත්වෙන ආකාරය පැහැදිලි කිරීම, විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය (LMS) හා අනෙකුත් අවශ්‍ය තොරතුරු සම්බන්ධයෙන් ඔබව දැනුවත් කිරීම සහ **බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නිල WhatsApp සමූහයට ඔබව ඇතුලත් කර ගැනීම** සිදුවන බැවින් **මේ සඳහා ඔබගේ සහභාගීත්වය අනිවාර්ය වේ.**

ඔබ නම්නීකරණ වැඩසටහනට සහභාගී විය යුතු වේලාව, උපාධි පාඨමාලාවට අදාළ ලියාපදිංචි අංකය, ශිෂ්‍ය වාර්තා පොත ලබාගත යුතු කණ්ඩායම යන තොරතුරු ලබා ගැනීමට පහත සබැඳියට (Link) පිවිස ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කරන්න.

https://results.external.sjp.ac.lk/env_orientation/

ශිෂ්‍ය වාර්තා පොත ලබා ගැනීම සඳහා මෙමගින් බාගත කරගත් විස්තර පත්‍රිකාව අනිවාර්යෙන් රැගෙන ආ යුතුය.

සැලකිලිමත් විය යුතුයි

- ✓ නම්නීකරණ වැඩසටහන ආරම්භ කිරීමට පෙර ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත ලබා දෙන බැවින් නියමිත වේලාවට අදාල ස්ථානයට පැමිණිය යුතුය.

- ✓ ඔබගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය රැගෙන ඒම අනිවාර්ය වේ.

- ✓ නම්නීකරණ වැඩසටහන සඳහා සහභාගීවීමේදී ඔබ විශ්වවිද්‍යාලයට සුදුසු ඇඳුමකින් සැරසී පැමිණිය යුතුය.

- ✓ බාහිර උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව හෝ වෙනත් ආධාර ලබා දීමක් සිදු නොවන බැවින් විශ්වවිද්‍යාලයෙන් පිටත හෝ විශ්වවිද්‍යාල භූමිය තුල එවැනි අවස්ථා ලබා දෙන බව පවසා විවිධ පුද්ගලයන් විසින් කරනු ලබන වංචනික ක්‍රියාවන්ට නොරැවටෙන ලෙස විශේෂයෙන් දන්වමි.

- ✓ නම්නීකරණ වැඩසටහන පැවැත්වෙන දින ඔබ විශ්වවිද්‍යාල භූමියට පැමිණි පසු යම් කිසි හදිසි අවශ්‍යතාවක් වෙතොත් පහත අංක හරහා අදාළ නිලධාරීන් පමණක් සම්බන්ධ කරගන්නා මෙන් වැඩි දුරටත් දැනුම් දෙමි. (මෙම දුරකථන අංක නම්නීකරණ වැඩසටහනෙ රාජකාරී සඳහා යොදවා ඇති කාර්යමණ්ඩලයේ පෞද්ගලික අංක වන බැවින් අත්‍යාවශ්‍යම කරුණකදී **එදිනට පමණක්** ඇමතීම සඳහා ලබාදී ඇත.)
    - 074 143 2705
    - 077 569 1269
- ✓ උපාධිය පාඨමාලාව සම්බන්ධ සියලුම අවශ්‍යතා සඳහා පහත කාර්යාල දුරකථන අංකය පමණක් ඇමතිය යුතු අතර ඔබ පාඨමාලාව හදාරණ කාලය තුල සියලු දැනුවත් කිරීම් www.external.sjp.ac.lk වෙබ් අඩවිය, WhatsApp සමූහය හා විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය (LMS) හරහා පමණක් සිදු වේ.
    - 011 280 1481 (සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 8.30 – ප.ව. 4.15)

සහකාර ලේඛකාධිකාරී

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

2026-11-11